**කාරතීවු ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කාරතීවු ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කාරතීවු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී දේශීය ණය සංවර්ධන අරමුදල සඳහා ගෙවිය යුතු ණය ප්‍රාග්ධනය මූල්‍ය ප්‍රකාශනයේ රු. 430,895 කින් අඩුවෙන් දක්වා තිබුණි. | වැරදි නිවැරදි කිරීමට පියවර ගනිමින් සිටින බව. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණු මහන මැෂින් වටිනාකම රු. 5,643,800 ක් මූල්‍ය ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් ලෙස දක්වා නොතිබුණි. | ඉදිරි මුදල් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගැලපීම කරන බව. | ස්ථාවර වත්කම් යටතේ දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ සූර්ය බලශක්තිය මගින් ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රු. 195,145ක් මූල්‍ය ප්‍රකාශනයේ ආදායම් හා ජංගම වත්කම් ලෙස දක්වා නොතිබුණි. | -එම- | අදාළ ආදායම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු. 14,749,080 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු. 3,947,941 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 25,000 | 9,180 | 9,180 | - | 25,000 | 3,000 | 3,000 | - |
| (ii) | කුලී | 8,675,000 | 7,690,625 | 6,766,985 | 2,699,890 | 8,275,000 | 6,353,768 | 4,567,470 | 1,786,297 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 850,000 | 1,271,240 | 1,271,240 | - | 3,355,000 | 3,286,750 | 3,286,750 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,215,000 | 561,704 | 561,704 | - | 6,530,000 | 2,630,622 | 2,630,622 | - |
| (v) | එකතුව | 1,0765,000 | 9,532,749 | 8,609,109 | 2,699,890 | 18,185,000 | 12,274,140 | 10,487,842 | 1,786,297 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අයවිය යුතු වෙළඳපොළ සහ වෙරළ උද්‍යානයේ කුලිය එකතුව රු. 75,843ක් පැවති අතර ඒවා වර්ෂ 1ක සිට වර්ෂ 15ක් දක්වා කාලයක් අයනොවී පැවතුණි. | පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලැබුණු පසු නීතිමය පියවර ගනු ලැබේ. ඒ වගේම මියගිය අයගේ මුදල් කපාහැරීමට පියවර ගෙන තිබේ. | අයවිය යුතු හිඟ ආදායම කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පෙර වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මිල කැඳවුම් මත මස් කඩය බදු දීමෙන් ලැබිය යුතු රු.2,008,592 ක් අයනොවී පැවතුන අතර, ඉන් රු.1,026,520 ක් වර්ෂ 2ක සිට වර්ෂ 33ක් දක්වා කාලයක් මස් කඩ 27 ක අයිතිකරුවන්ගෙන් අයවිය යුතුව තිබුණි. | අදාළ බදුකරුවන්ගේ තොරතුරු අස්ථානගතවීම හේතුවෙන් ගැලපීමට නොහැකිය. එම නිසා පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලිපියට අනුව කටයුතු කරන බව. | අයවිය යුතු හිඟ ආදායම කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ 2018 වර්ෂයේ සිට 2023 අවසානය දක්වා බැංකු ශේෂය ලෙස රු. 16,755,854 ක පැවතියද, සභාවට ආදායම් ලබාගත හැකි මාර්ග වල යෙදවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී හොඳ ආයෝජන අවස්ථා උදා වූ විට ඒ පිළිබඳව සලකා බලන බව. | අතිරික්ත ලෙස දැක්වෙන මුදල් සභාවේ අරමුණු ළඟාකරගත හැකි සුදුසු මූලාශ්‍රවල යෙදවීමට කටයුතු කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු සහ සභාව විසින් භාවිතා කරන ඉඩම්, ගොඩනැගිලි සහ වාහන 29 ක වටිනාකම් තක්සේරු කර එහි සත්‍ය වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී වටිනාකම් තක්සේරු කිරීමට කටයුතු කරන බව. | වත්කම්වල වටිනාකම් තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු ලොරි 04 ක්, සීසෑමේ යන්ත්‍ර 04 ක් සහ යතුරුපැදි 02 ක් අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට සභාව විසින් වසර 6 කට වැඩි කාලයක සිට කටයුතු කර නොතිබුණි. | මුදල් ලැබුණු විගස අලුත්වැඩියා කිරීමට කටයුතු කරන අතර අනෙකුත් වාහන වෙන්දේසි කිරීමට කටයුතු කරන බව. | අලුත්වැඩියා කර නැවත භාවිතයට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභා කාර්යාල ගොඩනැගිල්ල, සංස්කෘතික ශාලාව පිහිටි ඉඩම, පොදු වෙළඳපොළ ගොඩනැගිලි ඉඩම සහ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ මධ්‍යස්ථානය, යනාදිය සභාවේ නමට පවරා ගැනීමට විගණිත දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අඛණ්ඩව කටයුතු සිදුකරමින් පවතින බව. | වත්කම් වල හිමිකම සභාවේ නමට පවරා ගැනිමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභාව විසින් සමාලෝචිත වර්ෂයේ කුඩා ඇඟලුම් කර්මාන්තශාලාවක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය උපකරණ රු. 20,008,933 කට මිලදී ගත් නමුත්, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද ප්‍රමිතිය පරීක්ෂා කර ද්‍රව්‍ය ලබාගෙන නොතිබුණි. | වාර්තාව යාන්ත්‍රික ඉංජිනේරුවරයාගෙන් ලබාගැනීමට කටයුතු කරන බව. | තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව ඒකාබද්ධව අලුත් උපකරණ බව සනාථ කරගෙන වගකීම භාරගැනීම කළ යුතුය. |
| (ඉ) | උතුරු නැගෙනහිර වෙරළාශ්‍රිත ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු. 14,347,200 ක වැයකර ඉදිකිරීම් කර 2009 වසරේ සභාවට භාර දුන් කඩ කාමරවලින් කඩ කාමර 14 ක් වසර ගණනාවක සිට කුලියට දීමට සභාව කටයුතු කර නොතිබුණි. | පාරිභෝගික පැමිණීම අඩු බැවින් කඩවල් ගැනීමට කිසිවකු ඉදිරිපත් නොවීම නිසා ඇතැම් වෙළෙඳසල් භාවිතයට නොගෙන පැවතුණ බව. | නව ක්‍රමවේද ඇති කර සියලුම කඩවල් කුලියට දීමට පියවර ගත යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මියගිය සහ විශ්‍රාමික නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු. 32,860 ක හිඟ ණය මුදල අදාළ පුද්ගලයන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට 2006 වසරේ සිට සභාව කටයුතු කර නොතිබුණි. | හිඟ ණය අයකරගත හැකි අයගෙන් අයකර ගැනීමටත් ශේෂයන් කපා හැරීමටත් තීරණය කර ඇති බව. | අදාළ පුද්ගලයන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |